# සංචාරක සත්කාරක නිවාස දියුණු කිරීම සඳහා හරිත ණය වැඩසටහන යටතේ මූල්‍යමය සහයෝගය ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

### සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

★ පසුපස අමුණා ඇති (ඇමුණුම 01) උපදෙස් පත්‍රිකාව සම්පූර්ණයෙන් කියවා ඉල්ලුම්පත්‍රය පුරවන්න.
★ මෙම ණය මුදල දෙනු ලබන්නේ දැනට පවතින සත්කාරක නිවාසයක් නවීකරණය කිරීමට හෝ අලුතින් කාමර එකතු කිරීමට පමණි. නව ඉදි කිරීම් සඳහා ලබා ගත නොහැකිය.

**01.** අයත් වන කාණ්ඩය (අදාල කොටුව තුළ ✓ ලකුණ යොදන්න) අමුනා ඇති විස්තර පත්‍රය බලන්න

1.1 සංචාරක සත්කාරක නිවාස (උපරිම සංචාරක කාමර 04කට නොවැඩි) ☐
1.2 සංචාරක සත්කාරක බංගලා (උපරිම සංචාරක කාමර 04කට නොවැඩි) ☐
1.3 කුලී නිවාස (කුලී පදනම මත) ☐

**02.** 1.1 ඔව් නම් ඔබ දැනට එම නිවසේ පදිංචිද? ☐ ඉදිරියේදී පදිංචි වන්නේද? ☐

**02.** සංචාරක සත්කාරක නිවාසය හිමියාගේ හෝ පවත්වාගෙන යන අයගේ නම :

**03.** සංචාරක සත්කාරක නිවාසය හිමියාගේ හෝ පවත්වාගෙන යන අයගේ ලිපිනය :

**04.** සංචාරක සත්කාර නිවාසයේ ලිපිනය: (ඉහත ලිපිනයට වෙනස් නම)

**05.** නිවෙස් හිමියාගේ ස්ථාවර දුරකථන අංකය: සත්කාරක නිවසේ ස්ථාවර දු.ක. අංකය:

ජංගම දුරකථන අංකය:

**06.** සංචාරක සත්කාරක නිවාසයේ පිහිටම:

අ- පළාත:
ආ- දිස්ත්‍රික්කය:
ඇ- ප්‍රදේශීය ලේකම් කාර්යාලය:
ඈ- ග්‍රාම නිලධාරී කොට්ඨාශය:

**07.** මුල්‍ය පහසුකම අවශ්‍ය වන්නේ : අදාල කොටුවෙ ✓ ලකුණ යොදන්න

පවත්නා නිවස නවීකරණයට / අලුත් වැඩියාවට ☐ පවත්නා නිවසට කාමර කිහිපයක් එකතු කිරීමට ☐

පිලිතුර කාමර කිහිපයක් එකතු කිරීමට නම් අලුතින් ඉදිකරන කාමර ගණන: ☐

**08.** බලාපොරොත්තු වන **ණය** මුදල් ප්‍රමාණය: රුපියල්

**09.** අදාල බැංකුවේ:

අ- නම :
ආ- ශාඛාව :
ඇ- ලිපිනය :
ඈ)දුරකථන :
ඉ) ෆැක්ස් :
ඊ)විද්‍යුත් තැපෑල:

**10.** සංචාරක සත්කාරක නිවාසයේ වර්ථමාන තත්වය : ( අංක **07** ප්‍රශ්නයේ විස්තරාත්මක පැහැදිලි කිරීමක්) ඡායාරූප අමුනා එවිය යුතුය.

- පවත්නා නිවසේ ඉදිරිපස පෙනුම
- පහසුකම් වල ඡායාරූප (කාමර ඇතුලත/ නාන කාමර/ කෑම කාමරය/විසිත්ත කාමරය)
- සමස්ථය දැක්වෙන අයුරු දැක්වෙන ඡායාරූපයක්

**11.** අමුත්තන් සඳහා වෙන් කර ඇති කාමර සංඛ්‍යාව :

| | |
|---|---|
| අ) නාන කාමර සහිත: | |
| ආ) නාන කාමර රහිත : | |
| ඇ) මුළු කාමර ගනන : | |

★ අමුත්තන් සඳහා වෙන්වූ නාන කාමර තිබීම අත්‍යාවශ්‍ය වන අතර **එක් එක් කාමර වලට වෙන වෙනම නාන කාමර තිබීම වඩාත් යෝග්‍ය වේ.**

| 12. අමුත්තන්ගේ කාමර වල බිම් ප්‍රමාණයන් | |
|---|---|
| කාමරය | වර්ගඵලය (වර්ග අඩි) |
| කාමර අංක 01 | |
| කාමර අංක 02 | |
| කාමර අංක 03 | |
| කාමර අංක 04 | |
| නිවැසියන් පදිංචි කාමරය | |

| 13. සත්කාරක නිවසේ අනෙකුත් ඒකක වල බිම් ප්‍රමාණයන් | | |
|---|---|---|
| ඒකකය | ඇත | නැත |
| විසිත්ත කාමරය | | |
| මුලුතැන්ගෙය | | |
| කෑම කාමරය | | |
| වාහනයක් නැවැත්වීමට ඉඩ | | |

| 14. අමුත්තන්ගේ නාන කාමර වල බිම් ප්‍රමාණයන් | | | |
|---|---|---|---|
| නාන කාමරය | වර්ගඵලය (වර්ග අඩි) | කාමරයට යාබදව ඇත | කාමරයට යාබදව නැත |
| නාන කාමර අංක 01 | | | |
| නාන කාමර අංක 02 | | | |
| නාන කාමර අංක 03 | | | |
| නාන කාමර අංක 04 | | | |
| නිවැසියන්ගේ නාන කාමරය | | | |

**15.** අලෙවිකරණ ක්‍රම විධි :

අ) වෙබ් ලිපිනය :

ආ) වෙළඳ දැන්වීම :

ඇ) චාරිකා නියෝජිත ආයතන :

ඇ) වෙනත් ( විස්තර සපයන්න) :

**12.** අවට ඇති පාරිසරික ආකර්ශන හා ඒවාට ඇති ආසන්න දුර :

10. සංචාරක සත්කාරක නිවාසයේ පාරිසරික යෝග්‍යතාවය : (අමුණුමේ 3 වන පරිච්ජේදය බලන්න

*අවශ්‍ය ලියකියවිලි*

| *අනු අංකය* | *ලියකියවිලි* | *අමුනා ඇත* |
|---|---|---|
| *1* | *ඔප්පු පිටපත හෝ බදු පත්‍රයේ පිටපත (ඔබගේ අයිතිය තහවුරු කර ගැනීමට)* | |
| *2* | *නිවසේ අයිතිය අයදුම්කරු වෙත නොමැතිනම් එය තම පවුලේ සාමාජිකයෙකුගේ නමට පවරනවා නම් දිවුරුම් ප්‍රකාශයක්* | |
| *3* | *ග්‍රාම නිළධාරී සහතිකය: (සත්කාරක නිවාසයක් පවතිවාගෙන යාමට බාධාවක් නොවන බවට)* | |
| *4* | *ගොඩනැගිලි සැළැස්ම සම්පූර්ණයෙන් නිදන කාමර 4 ට වඩා වැඩිනම් තමන් එම නිවසේ පදිංච බවටත් පදිංච අය සඳහා භාවතා වන නිදන කාමර ප්‍රමාණය ග්‍රාමසේවක මගින් සහතික කළ ලිපියක්* | |
| *5* | *පොලිස් වාර්තාව (විරෝධතාවයක් සහ නීතිමය බාධාවක් නොමැති බවට)* | |
| *6* | *ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංච වන බවට සහතික වන ලිපියක්* | |
| *7* | *ජා.හැ.පතේ පිටපතක් (සත්කාරක නිවස පවත්වාගෙන යන අයගේ)* | |
| *8* | *ගොඩනැගිලි සැලැස්මේ පිටපතක්* | |

★ **ඉහත ඉල්ලා ඇති එකදු ලියකියවිල්ලක් හෝ නොමැතිනම් ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින් අයදුම්පත්‍රය නැවත ඔබ වෙත එවන බව කරුණාවෙන් සලකන්න.**

ඉල්ලුම් කරුගේ නම :...............................................................................................

ඉල්ලුම් කරුගේ අත්සන :...............................................................................................

දිනය :...............................................................................................

නිවැරදිව සම්පූර්ණ කරන ලද ඔබගේ ඉල්ලුම් පත්‍රය, "අධ්‍යක්ෂ, සංචාරක සැළසුම් හා සංවර්ධන, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, අංක. 80, ගාලු පාර, කොළඹ 03" ( **කවරය ඉහල දකුනු කෙලවර - සංචාරක සත්කාරක නිවාස දියුණු කිරීම සඳහා හරිත ණය වැඩසටහන යටතේ මූල්‍යම සහයෝගය ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය**" ලෙස සඳහන් කරන්න) ලිපිනයට තැපැල් කර එවන මෙන් දන්වා සිටින අතර අයදුම් පත ලැබමෙන් අනතුරුව අප විසින් එය ඇගයීමකට ලක් කර එය අදාල නිර්නයන් හා ගැලපේ නම් ඒ පිළිබඳ නිර්දේශ අදාල බැංකු ශාඛාව වෙත ඔබටද පිටපතක් සහිතව යැවීමට කටයුතු කරනු ලැබේ.

වැඩි විස්තර සඳහා පහත දුරකථනයන්ට අමතන්න
011-2437058 (කාර්යාලය)
011-2426800 (දිගුව- 204)

## 01. සංචාරක සත්කාරක නිවාසයක් යනු

ශ්‍රී ලංකාව තුළ විවිධ ගමනාන්තයන්හි ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය ගෙන ඒම සඳහා විවිධ තේමාවන් රැගත් නිවාස නවාතැන් ඒකක ලෙස සකස් කිරීම මගින් සමාජයේ සාධාරණ වෙනසක් සඳහා සංචාරක ප්‍රතිලාභ ලබා දීම අරමුණු කර ගත් ප්‍රජාව පදනම් කරගත් සංචාරක වැඩසටහනකි. සංචාරකයින්ට පහසුකම් සැලසීමේ අරමුණින් සුදුසු ගුණාත්මක ප්‍රමිතින් සහිත සංචාරකයින් සමග දේශිය ප්‍රජාව අතර අන්තර් සම්බන්ධතාවක් ඇති කිරීම සඳහා ශ්‍රී ලාංකික ජීවන රටාව අතිවිඳිමට සංචාරකයින්ට අවස්ථාවක් ලබා දීම මෙම සංකල්ප යටතේ අරථ දැක්විය හැකි නිවාස පමණක් සත්කාරක නිවාස වැඩසටහන යටතේ ලියාපදිංචි වීමට සුදුසුකම් ලබනු ඇත. ශ්‍රී ලාංකික නිවසක් තුළ ශ්‍රී ලාංකික නිවැසියන් සමග දේශිය ආහාරපාන, සිරිත් විරිත් හා ආගන්තුක සත්කාර අතිවිඳිමින් ශ්‍රී ලාංකිය ජිවන රටාව හා සංස්කෘතිය වටනාකම පිළිබඳ සැබෑ මෙන්ම අගනා අතිදැකිම ලබමින් දිවයින තුළ නිවාඩුවක් ගත කිරීමට සංචාරකයන් හට ඉඩ සලසා දීම සංචාරක සත්කාරක නිවාසයකින් සිදු කෙරෙන සේවාවයි.

## 02. සංචාරක සත්කාරක නිවාස යටතේ අනු කාණ්ඩයන්

- **සංචාරක සත්කාරක නිවාස**

ඔබ පදිංචි නිවස තුළ ඇති කාමරයක් හෝ කිහිපයක් තුළ (උපරිම කාමර 04ක්) සංචාරකයින් හට නවාතැන් පහසුකම සඳහා ලබා දී ඔවුන් සමග එක්ව ශ්‍රී ලාංකික දිවි පෙවෙත පිළිබඳ අත්දැකිම් ලබා ගැනිමට ඔවුනට ඉඩ සලසා දීම.

- **තේමා ගමමාන නිවාස / සත්කාරක බංගලා**

බංගලා භාරකරුවකු හෝ **ගෘහ පාලකයෙකු වැනි** අයෙකු යොදා ගෙන අවම ආගන්තුක සේවා පමණක් සපයමින් පවත්වාගෙන යනු ලබන කිසිවෙක පදිංච නොවන සම්පූර්ණ නිවසකි. ( උපරිම අමුත්තන්ගේ කාමර 04ක් හා සේවා සපයන්නා සඳහා ඇති කාමරය ඇතුලු කාමර 05ක් පමණක් තිබිය හැක.)

- **කුලි නිවාස ඒකක**

නිශ්චිත කාලයක් සඳහා සංචාරකයින් සඳහා කිසිදු සේවාවක් සපයා නොදී කුලි පදනම මත උපරිම කාමර පහක් සහිත සම්පූර්ණ නිවසක් (උපරිම කාමර 04ක්) :(**වසරකට අඩු** කාලයක් සඳහා) සියළුම අත්‍යවශ්‍ය **පහසුකම්** සහිතව සම්පූර්ණ නිවසක් ලබා දීම.

## 03. මෙම ණය පහසුකම් ලබා ගැනිමෙන් අනතුරුව ඔබ සංචාරකයන් සඳහා සේවාවන් ලබා දීම ආරම්භ කිරීමට ප්‍රථම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ - සංචාරක සත්කාරක නිවස˜ වැඩසටහන යටතේ ඔබ ලියාපදිංචි විය යුතුය. ඒ සඳහා ඔබ නිවසේ තිබිය යුතු මුලික අවශ්‍යතා / පහසුකම් පහත දක්වා ඇත.

- අදාල ප්‍රදේශයේ හා නිවසේ පිහිටීම සංචාරක සත්කාරක නිවාසයක් සඳහා සුදුසු විය යුතුය.
- නිවස වෙත පිවිසිමට සුදුසු ප්‍රවේශ මාර්ගයක් තිබිය යුතුය.
- නිවසේ තත්වය සංචාරක නිවාසයක් සඳහා සුදුසු විය යුතුය.
- ගෙමිදුල සංචාරක නිවාසයක් සඳහා සුදුසු විය යුතු අතර මනාව නඩත්තු කල යුතු වේ.
- නිවස ඇතුළත, පිටත හා ගෘහ භාණ්ඩ ආදිය මනාව නඩත්තු විය යුතුය.
- වාහන නවතා තැබීමේ පහසුකම තිබිය යුතුය.
- තනි නිදන කාමරයක ප්‍රමාණය අවම වශයෙන් වර්ග අඩි 100ක් හා යුගල නිදන කාමරයක ප්‍රමාණය අවම වශයෙන් වර්ග අඩි 120ක් විය යුතුය.
- නාන කාමරයක ප්‍රමාණය අවම වශයෙන් වර්ග අඩි 30ක් විය යුතුය.